# දකුණු පළාත් සභාව
# දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය.
# ලංසු සඳහා ආරාධනාවයි

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙනුවෙන් ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන්කර ඇති කොන්ත්‍රාත්තුව සඳහා නිපුණතා පූර්ණ සහ සුදුසුකම් සහිත ලංසුකරුවන් වෙතින් වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

| අනු අංකය | කොන්ත්‍රාත්තුවේ නම | කොන්ත්‍රාත් අංකය | ප්‍රමාණ පත්‍ර මුදල (රු:)මිලියන | CIDA කාණ්ඩය | ලංසු සුරක්ෂණය (රු:) | ආපසු නොගෙවන ගාස්තුව (රු:) |
|---|---|---|---|---|---|---|
| 01 | දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය පැති බැම්ම ඉදිකිරීම. | SP/CS/LCB/21/10 | 32.74 | C5/ C4 | 350,000.00 | 5,000.00 |

2. ජාතික තරඟකාරී ලංසු පටිපාටිය මත ලංසු ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත් ප්‍රදානයේ දී සුදුසුකම් ලබන සාර්ථක ලංසුකරුවන් අසාදු ලේඛනගත නොවිය යුතු අතර " CIDA" ඉහත කාණ්ඩ යටතේ ලියාපදිංචි වී සිටිය යුතුය.

3. මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 04/2016(iii) හා 2021.02.18 දින අනුව මෙම ප්‍රසම්පාදනයන්හි මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 50ට අඩු බැවින් කොන්ත්‍රාත්කරුවන් ගේ පළාත් ප්‍රමුඛතාවය හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ශ්‍රේණියේ (CIDA Grade) ප්‍රමුඛතාවය ලංසු ඇගයීමේ දී සැලකිල්ලට ගනු ලැබේ. තව ද රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 03/2020 හා 2020.10.09 දිනැති සහ 03/2020(i) හා 2021.01.11 දිනැති චක්‍රලේඛවල සඳහන් පරිදි කොන්දේසි ද අදාළ වේ.

4. අභිලාෂයක් දක්වන නිපුණතාපූර්ණ ලංසු තබන්නන් විසින් වැඩිමනත් තොරතුරු සහ ලංසු ලියකියවිලි **2021.06.21** දින සිට **2021.07.12** දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ:ව: **9.00** සිට ප:ව: **3.00** දක්වා **ඉහත සඳහන් ගාස්තු ගෙවීමෙන් ගාල්ල, එස්.එච්. දහනායක මාවතේ පිහිටි ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැපයුම් අංශයෙන් ලබාගත හැකිය.**

5. ලංසුව සමග ඉදිරිපත් කරනු ලබන ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් නමට ලබාගත් 2021.11.10 දින දක්වා වලංගු ලංසු ඇපකරයක් හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබාදෙන මුදල් කුවිතාන්සිය ලංසු පත්‍රිකාව සමග ඉදිරිපත් කළ යුතුය. චෙක්පත් හෝ බැංකු අණකර ලෙස ඉදිරිපත් කරන ලංසු ඇපකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ඉදිරිපත් කරනු ලබන කොන්ත්‍රාත්තුවට අදාළ ලංසු පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, එහි මුල් පිටපතෙහි **මුල් පිටපත** යනුවෙන් සඳහන් කළ යුතු අතර අනු පිටපතෙහි **අනු පිටපත්** යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසුපත්වල මුල් පිටපත හා අනු පිටපත වෙන වෙන ම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා එම කවරය ද මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

7. සම්පූර්ණකරන ලද ලංසු පත්‍රිකා ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු අංකය හා විස්තරය සඳහන් කළ යුතුය. මුද්‍රා තබන ලද ලංසු පත්‍රිකා 2021.07.14 දින පෙ:ව: 10.30 ට පෙර ලැබෙන ලෙස සභාපති, ප්‍රසම්පාදන කමිටුව, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ අතින් රැගෙන'විත් ගණකාධිකාරී (සැපයුම්) නිල කාමරයේ තබා ඇති ලේඛනයේ සටහන් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ඉදිරිපත් කරන ලංසුව වලංගු කාලය 2021.10.14 දින දක්වා වේ.

8. ලංසුපත් විවෘත කිරීම 2021.07.14 දින ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරු ගේ බලයලත් නියෝජිතයෙක් හට සහභාගී විය හැකිය.

9. පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2021.07.05 දින පෙ:ව: 10.30ට දකුණු පළාත් ප්‍රධාන ලේකම් ගේ ප්‍රධානත්ත්වයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්වේ. අභිලාශී ලංසුකරුවන්ට මෙම රැස්වීම සඳහා සහභාගීවිය හැක.

10. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බව සලකන්න.

11. වැඩිදුර විස්තර සඳහා,
දිස්ත්‍රික් ඉංජිනේරු, දිස්ත්‍රික් ඉංජිනේරු(ගොඩනැගිලි) කාර්යාලය, ගාල්ල.(දු.අ 914941546)

සැලකිය යුතුයි : ටෙන්ඩර් දැන්වීම දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ www.cs.sp.gov.lk වෙබ් අඩවියෙහි දිස්වනු ඇත.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**එස්.එච්.දහනායක මාවත,**
**ගාල්ල.**

දිනය : 2021.06.15
ෆැක්ස් : 091 – 2242697
දුරකථන අංකය : 091 – 4944016/ 091-4946368
ඊ මේල් : supply@cs.sp.gov.lk